යුදෙව්වන්ට හා කිතුනුවන්ට අල්ලාහ් ශාප කළේය. ඔවුන් ඔවුන්ගේ නබිවරුන්ගේ සොහොන් ගැබ් මස්ජිද් බවට සකසා ගත්තෝය

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව දේවත්වය විශ්වාස කරන්නන්ගේ මෑණියක වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී: "යුදෙව්වන්ට හා කිතුනුවන්ට අල්ලාහ් ශාප කළේය. ඔවුන් ඔවුන්ගේ නබිවරුන්ගේ
සොහොන් ගැබ් මස්ජිද් බවට සකසා ගත්තෝය. ඇය තවදුරටත් මෙසේ පැවසුවාය: "එසේ
නොවීනම්, එතුමාණන්ගේ මිනීවල හෙළි කරනු ලබන්නට තිබුණි. නමුත් එතුමා එය නැමදුම් ස්ථානයක් ලෙස ගනු ලැබීම ගැන බිය වූහ." [صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මරණ මංචකයේ දැඩි සේ රෝගාතුරව සිටිය දී මෙසේ ප්රකාශ කළ බව උම්මුල් මුඃමිනීන් හෙවත් දේවත්වය විශ්වාස කරන්නන්ගේ මෑණියක වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් දන්වා සිටියාය. "යුදෙව්වන්ට හා කිතුනුවන්ට අල්ලාහ්ගේ ශාපය වේවා! ඔහුගේ කරුණාවෙන් ඔවුන් නෙරපා හරිත්වා! එය ඔවුන් ඔවුන්ගේ නබිවරුන්ගේ සොහොන් ගැබ් මස්ජිද් බවට සකසා ගත් බැවින් හා ඒ මත ගොඩනැගිලි ඉදි කිරීම හෝ ඒ අබියස හෝ ඒ වෙත යාඥා කටයුතු සිදු කළ බැවිනි." පසුව ඇය මෙසේ පවසා සිටියා ය. "එම තහනම හෝ අවවාදය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් සිදු කරනු නොලැබුවේ නම් යුදෙව්වන් හා කිතුනුවන් තමන්ගේ නබිවරුන්ගේ සොහොන් සමග ක්රියා කළ පරිදි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මිනීවල සමග ක්රිය කරනු ඇතැයි සහාබාවරු බිය නොවී නම්, එතුමාණන්ගේ මිනීවල හෙළි කරනු ලැබ ප්රසිද්ධියට පත්වන්නට තිබුණි."

https://sunnah.global/hadeeth/si/show/5379